**ජා-ඇල නගර සභාව - 2021**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------**

ජා-ඇල නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජා-ඇල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිති අංක 3.5 අනුව හා අංක LGD/10A/4/න.ගි/2019 දරන පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 12 දිනැති ලිපිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දේපළ, පිරියත හා උපකරණ කාණ්ඩ 14 ක් යටතේ වර්ගීකරණය කළ යුතු වූවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාලයීය උපකරණ, පරිගණක මෘදුකාංග සහ මංමාවත්, බෝක්කු හා පාලම් වැනි වත්කම් කාණ්ඩගත කර නොතිබුණි. | රට තුළ ඇතිවූ කොරෝනා තත්ත්වය හේතුවෙන් ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කිරීමට නොහැකිවූ බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ආ) ප්‍රමිති අංක 18.7 හා අංක LGD/10A/4/න.ගි./2019 දරන පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති ලිපිය ප්‍රකාර සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද සභාවේ යන්ත්‍ර උපකරණ, මෝටර් රථ හා කරත්ත, ළී බඩු හා සවිකිරීම් ප්‍රත්‍යාගණනය කර නොතිබූ අතර සභාව සතු ඉඩම් කැබලි 252 න් ඉඩම් කැබලි 17 ක් පමණක් තක්සේරුකර වටිනාකම ගිණුම්ගත කර තිබුණි. | 2022 අවසාන ගිණුම සකස් කිරීමේදී ප්‍රත්‍යාගණනය සිදු කොට ගිණුම්ගත කිරීමට හා ඒ අනුව ක්ෂය කිරීම් සිදුකිරීමටද පියවර ගනු ලබන බව දන්වමි. | |
| (ඇ) ප්‍රමිති අංක 9.9 ප්‍රකාරව හා පළාත් පාලන ආයතන සඳහා වන ප්‍රමිති උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුලත් EG 2.7 වගන්තිය ප්‍රකාරව ලැබුණු මුළු ප්‍රාග්ධන වියදම් ප්‍රදානවලින් වර්ෂය තුළ විස්තීර්ණ ආදායමට හඳුනාගත් ප්‍රමාණය අඩු කොට ඉතිරිය අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන ලෙස සටහන් අංක 10 යටතේ දැක්විය යුතුය. නමුත් | ඉදිරියේදි ජර්නල් සටහන් යොදා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.10,829,000 ක ප්‍රාග්ධන ආධාර මුළු වටිනාකම, සටහන් අංක 05 යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා තිබු අතර ඉකුත් වර්ෂයේ රු.16,438,272 ක් වූ ප්‍රාග්ධන වියදම් ප්‍රදානවලින් ප්‍රාග්ධනිත කළ වටිනාකමට අදාල ක්ෂය කිරීම් කළ යුතු වූවද එසේ කර නොතිබුණි. | | |
| (ඇ) | පළාත් පාලන ආයතන සඳහා වන ප්‍රමිති උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුලත් EG 3.2 වගන්තිය ප්‍රකාරව මංමාවත් බෝක්කු සහ වෙනත් යටිතල පහසුකම් අයිතමයන් දේපළ, පිරියත සහ උපකරණ යටතේ වෙනස් ගිණුම්කරණ ක්ෂේත්‍ර යටතේ ගිණුම්ගත කළ යුතු වුවද 2020 වර්ෂයේ රු.29,567,827 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.14,741,154 ක් වැයකර සංවර්ධනයකළ පාරවල්, බෝක්කු, කාණු හා පැති බැම් එපරිදි ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ජ'නල් සටහන් යොදා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඉ) | ප්‍රමිති උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුලත් EG 3.1 වගන්තිය ප්‍රකාරව කෙරීගෙන යන යම් ප්‍රාග්ධන වැඩ වෙතොත් ඒවා දේපළ, පිරියත හා උපකරණ උපලේඛනයේ වෙනම ප්‍රභේදයක් ලෙස දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට ඇස්තමේන්තු වටිනාකම රු.6,225,000 ක් වූ කෙරීගෙන යන කර්මාන්ත 02 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | කෙරීගෙන යන වැඩ හා කර්මාන්ත උපලේඛන එම අංශයෙන් ඉදිරිපත් නොවූ බව වාර්තා කරමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | ප්‍රමිත අංක 9 හා 10 ප්‍රකාරව හුවමාරු ගණුදෙනුවලින් වන අයභාරය හා හුවමාරු නොවන ගනුදෙනුවලින් වන අයභාරය වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද සභාවේ රු.173,766,641 ක් වූ සියලු ආදායම් එපරිදි වෙන් වෙන්ව හඳුනාගැනීමකින් තොරව හුවමාරු නොවන ගණුදෙනුවලින් ලද අයභාරය ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව වාර්තා කරමි. | |
| (උ) | අංකLGD/10A/4/න.ගි/2019 දරන පළාත් පාලන කොමසාරිස්ගේ 2020 සැප්තැම්බර් 18 දිනැති ලිපිය ප්‍රකාරව වත්කම් සඳහා ක්ෂේත්‍ර අංක 2112 යටතේ ප්‍රාග්ධන වැය දැක්විය යුතු වූවද ප්‍රාග්ධන වැය ගිණුමේ ශේෂය වූ රු.28,438,602 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මුල්‍ය පිරිවැය යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී ජ'නල් සටහන් යොදා නිවැරදි කිරීමට කටයුතු කරන බව වාර්තා කරමි. | |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ප්‍රමිති උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුලත් EG 3.3 ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී සභාවේ දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කර නොතිබුණි. | 2022 අවසාන ගිණුම සකස් කිරීමේදී මෙම අයිතමයන් ප්‍රත්‍යාගණනය සිදු කොට ගිණුම්ගත කිරීමට හා ඒ අනුව ක්ෂය කිරීම් සිදුකිරීමටද පියවර ගනු ලබන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. |
| (එ) | නිදර්ශනාත්මක ආකෘතිවල සටහන් අංක 4 යටතේ පුනරාවර්ථන වියදම් සඳහා රජයේ දායකත්වය සටහන් කළ යුතු වුවද රු.72,845,000 ක් වූ රජයේ දායකත්ව මුදල සටහන් අංක 4 යටතේ සටහන් නොකර සටහන් අංක 6 යටතේ සටහන් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව වාර්තා කරමි. | |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සත්‍ය වශයෙන්ම සභාවට නොලැබෙන ගිවිසුම්ගත නොවූ කඩකාමර 03 ක් වෙනුවෙන් ලැබිය යුතු යතුරු කාසි මුදල් ලෙස රු.2,066,119 ක මුදලක් ගිණුම්ගත කර තිබුණි. | ආදායම් විෂය මඟින් තහවුරුවක් ලබා දී තිබූ හෙයින් ඒ අනුව ගිණුම් ගත කිරීමට කටයුතු කොට ඇති බව දන්වමි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කිරීමේදී සභාවේ මුද්දර ගාස්තුවලින් වාහන ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අඩුකර ගෙන තිබුණු ණය වාරික වටිනාකම රු.1,086,000 ක් මුද්දර ගාස්තු ආදායමට බැර කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව වාර්තා කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | මුදල් ලැබී, ගෙවා අවසන් කර්මාන්ත 03 ක් හා ගිවිසුම්ගත වී නොමැති කර්මාන්ත 02 ක් සඳහා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස රු.2,220,933 ක් ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගෙවා අවසන් කර්මාන්ත 03 ණයහිමි ලෙස ඉදිරිපත් කර තිබුණද විගණනයට කාලවකවානුව වන විට එම වසරවල අවසන් ගෙවීම සිදු කර තිබූ බව දන්වමි. | |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමියන් රු.10,344,939 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගෙවා අවසන් ණයහිමියන්, ණයහිමි ලේඛනයෙන් ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ |
| (ඉ) | මෙහෙයුම්, ආයෝජන හා මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වන මුදල් ප්‍රවාහයන් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වුවත් ජංගම නොවන වත්කම්වල ප්‍රත්‍යාගණිත වටිනාකම රු.3,688,787,625 ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වන මුදල් ප්‍රවාහයක් ලෙසද සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ජංගම නොවන වගකීම් ශේෂය රු.9,016,400 ක් මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වන මුදල් ප්‍රවාහයක් ලෙස සාවද්‍ය ලෙස මුදල් ප්‍රවාහයේ දක්වා තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා මෙම වටිනාකම 2021 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කොට නොතිබූ බැවින් මෙම ප්‍රත්‍යාගණීත වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වන ලද බව දන්වමි. | |

### 1.6.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 10 ක 2021 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු.29,815,327 ක වෙනස්කම් විය. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.4 අධිකාරි බලයකින් තොර ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොවිඩ් වසංගතය හේතුවෙන් සභාව විසින් බදු දී තිබූ වත්කම් 04 ක 2020 හා 2021 වර්ෂ සඳහා අයවිය යුතු බදු මුදල් රු.975,220 ක් සභා තීරණ මත කපා හැර අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර තිබුණද විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති අතර 2021 ඔක්තෝබර් 07 හා 2022 මැයි 25 දිනැතිව සිහිකැඳවීම් ලිපිද යවා ඇති බව දන්වමි. | අදාළ අනුමැතින් ලබා ගත යුතුවේ. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) අංක 104(1) | යකඩ දැලක් හා රු.140,000 ක් වටිනා යකඩ ග්‍රේඩර් සොරකමක් සම්බන්ධයෙන් පොලිසියේ පැමිණිල්ලක් දැමීම හැර කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පොලිසිය මඟින් සිදුකළ පරීක්ෂා වලින් ද සොරකමට අදාළ සැකකරුවන් මෙතෙක් හඳුනාගැනීමට හැකියාව ලැබී නැති බව දන්වමි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) අංක 371(ඇ) | 2021 වර්ෂයට පෙර අවස්ථා 02 කදී ලබාදී තිබූ රු.137,749 ක අතුරු අග්‍රිමයන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.44,943,673 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,949,338 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකමින් රු.50,000 ඉක්මවා තිබූ වරිපනම් ඒකක 108 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකම රු.12,535,903 ක් වී තිබූ අතර එයින් 2022 අප්‍රේල් 19 දිනට ඒකක 15 කින් රු.2,185,939 ක් පමණක් අයවී තිබුණි. | ඉතිරි මුදල අය කර ගැනිම සඳහා දේපල තහනම් කිරිමට අදාල රතු නිවේදන නිකුත් කර ඇති බව දන්වමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 2016 නොවැම්බර් 01 දිනැති අංක LGD/13/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව ගිවිස ගත් දිනෙන් සෑම වසර තුනකට වරක් මාසික කුලිය, තක්සේරුවක් මත ප්‍රතිශෝධනය විය යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ජා-ඇල පොදු වෙළඳපල ව්‍යාපාරික ස්ථාන 105 කින් 2011 වර්ෂයේ තක්සේරුවක් මත කඩකුලී අයකර තිබුණි. 2018 මැයි 25 දින ලැබී තිබූ නව තක්සේරුව 2020 සැප්තැම්බර් 10 දින සිට ක්‍රියාත්මක කිරීමට සභා තීරණයක් ගෙන තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබූ අතර 2021 ඔක්තෝබර් 29 දින ලැබී තිබූ නව තක්සේරුවද ක්‍රියාත්මක කර නොතිබුණි. 2020 ඔක්තෝබර් සිට 2022 මැයි 31 දින දක්වාම කඩ කුලී ගෙවිම පැහැර හැර තිබූ අතර සභාව විසින් කුලී නොගෙවීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව කඩ කාමර 105 න් 2021 දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ කුලිය රු.13,568,720 ක් විය. | 2021 නොවැම්බර් 29 දිනැතිව සංශෝධිත නව තක්සේරුවක් ලැබි ඇති හෙයින් ඒ අනුව කඩ කාමරවල ගිවිසුම් අළුත් කිරිම සඳහා කඩකාමර බදුකරුවන් වෙත නව තක්සේරුව සමග ලිඛිතව දන්වා යවා කඩකුලිය අය කිරිම සම්බන්ධව කටයුතු කරමින් පවතින බව දන්වමි. | ලැබී ඇති තක්සේරු අනුව කුලී අය කරගත යුතු අතර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නව වෙළඳපල කඩ කුලී කාමර 60 කින් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.761,225 ක් වූ අතර බොහෝ කඩ කාමරවල ගිවිසුම් කාලය ඉකුත්වී තිබුණද නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමරවල ගිවිසුම් අළුත් කිරිම සදහා කඩකාමර බදුකරුවන් වෙත නව තක්සේරුව සමග ලිඛිතව දන්වා යවා කඩකුලි අය කිරිම සම්බන්ධව කටයුතු කරමින් පවතින බව දන්වමි | ගිවිසුම් කාලය අවසන්වූ වහාම නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------- | ------------ |
| කොම්පෝස්ට් නිපදවීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සදහා කෞෂිමා යන්ත්‍රයක් ලබා දෙන බවට බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ලිඛිතව දන්වා නොතිබියදී සුදුවැල්ල කොම්පෝස්ට් අංගනය පිහිටි ඉඩමේ කෞෂිමා යන්ත්‍රයක් සවි කිරීම සදහා පස් පරීක්ෂා කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට රු.483,000 ක මුදලක් 2021 ඔක්තෝබර් 21 දින ගෙවා තිබුණද විගණන දින වන 2022 මාර්තු 31 දින වන විටත් මෙම යන්ත්‍රය ලබා ගෙන ස්ථානගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාපතිවරයා විසින් ලබාදුන් වාචික උපදෙස් මත මෙය ඉටුකර ඇත. | කඩිනමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළයුතුය. |